# 2561 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2016 (2017)

## (02) බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය

**S 2**

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

### II කොටස

2. (i) සරණාගමන පැවිද්ද යනු කුමක්දැයි පහදා දෙන්න. (ලකුණු 04 යි)
   (ii) විනයෙහි සඳහන් පැවිදි කිරීමට නුසුදුසු පුද්ගලයන් හයදෙනෙකු ලියන්න. (ලකුණු 06 යි)
   (iii) එම පුද්ගලයන් පැවිද්දට සුදුසු නොවන්නේ කවර හේතු නිසාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

3. (i) ධම්මික සූත්‍රයෙහි සඳහන් ගිහි ප්‍රතිපදාවට අයත් ශික්ෂා හතරක් ලියන්න. (ලකුණු 04 යි)
   (ii) අලසකමේ දෝෂ හය සිඟාලෝවාද සූත්‍රයෙහි එන ආකාරයෙන් දක්වන්න. (ලකුණු 06 යි)
   (iii) අලසකම වස්තු විනාශයට කෙසේ හේතුවන්නේදැයි විස්තර කරන්න. (ලකුණු 08 යි)

4. (i) දීඝජාණු කෝලිය පුත්‍රයා බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ කළ ඉල්ලීම ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දැක්වෙන ලෙස ලියන්න. (ලකුණු 04 යි)
   (ii) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි සඳහන් මෙලොව හිත සුව පිණිස හේතුවන කරුණු පෙන්වා දී කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)
   (iii) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දැක්වෙන 'සද්ධා සම්පදාව' පරලොව දියුණුවට කෙසේ හේතු වන්නේදැයි පහදන්න. (ලකුණු 08 යි)

5. (i) සිංහලට නගන්න.
   (අ) 'අථ බො ධම්මිකො උපාසකො පඤ්චහි උපාසක සතෙහි සද්ධිං යෙන භගවා තේනුපසංකමි'
   (ආ) 'වන්දාමි චෙතියං සබ්බං - සබ්බඨානෙසු පතිට්ඨිතං'
   (ඉ) 'සො එවං අත්තනො සබ්බං ධනං විස්සජ්ජෙත්වා දානං අදාසි'
   (ඊ) 'අතීතෙ ජම්බුදීපෙ අමරවතී නාම නගරං අහොසි තත්ථ සුමෙධො නාම එකො බ්‍රාහ්මණ කුමාරො විහරති'
   (ලකුණු 08 යි)

   (ii) මෙම වාක්‍ය පාලියට නගන්න.
   (අ) මෙම දානය අපි භික්ෂු සංඝයාට දෙමු.
   (ආ) සියලු සත්වයෝ මියයන්නාහ.
   (ඉ) පිදිය යුතු අය පිදීම උතුම් මංගල කරුණකි.
   (ඊ) අපි විහාරයට ගොස් බුදුරජාණන් වහන්සේ බලමු.
   (උ) අතීතයෙහි බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජතුමා රාජ්‍ය කළේ ය.
   (ලකුණු 10 යි)

6. (i) මෙම පාඨය සිංහලට නගන්න.
   බොධිසත්තො කපිගණං ආදාය තත්ථ ඵලානි ඛාදන්තො එකස්මිං කාලෙ ඉමස්ස උදකෙ පතිත ඵලං නිස්සාය අම්හාකං භයං උප්පජ්ජිස්සතී'ති උදකමත්ථකෙ සාඛාය එකං ඵලංපි අනවසෙසෙත්වා පුප්ඵකාලෙ කළායමත්ත කාලතො පට්ඨාය ඛාදාපෙති. (ලකුණු 08 යි)

   (ii) මහා කපි ජාතකයෙහි දැක්වෙන වඳුරු රජුගේ චරිතය තුළින් පාලකයෙකු තුළ පැවතිය යුතු විශිෂ්ට ගුණාංග තුනක් පහදා දෙන්න. (ලකුණු 10 යි)

7. (i) මෙම පාඨය සිංහලට නගන්න.
   "කොනුඛො භික්ඛවෙ අග්ගාසනං අග්ගොදකං අග්ගපිණ්ඩං අහරන්තීති? එකච්චේ ඛත්තිය කුලා පබ්බජිතා ආහංසු. එකච්චෙ බ්‍රාහ්මණකුලා ගහපති කුලා පබ්බජිතොති, අපරෙ විනයධරො ධම්මකථිකො පඨමස්ස ඣානස්ස ලාභි, දුතියස්ස තතියස්ස චතුත්ථස්ස ඣානස්ස ලාභිති, අපරෙ සොතාපන්නො සකදාගාමී අනාගාමී අරහා තෙවිජ්ජො ඡළභිඤ්ඤො'ති ආහංසු." (ලකුණු 08 යි)

   (ii) බුද්ධ ශාසනයෙහි වැඩිමහලු පිළිවෙළ ක්‍රියාත්මක වන ආකාරය තිත්තිර ජාතකය ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

***